**ජාතික තරුණ සේවා සභාව - 2023**

---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික තරුණ සේවා සභාවේ (“සභාව”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනත, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ  මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින්  ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාවේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ **අධ්‍යක්ෂ** මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට එරෙහිව කොන්ත්‍රාත්කරුවකු විසින් පවරා තිබුණු නඩුවක තීන්දුව මත 2024 වර්ෂයේදී රු.මිලියන 5.92ක් ගෙවා තිබුණද, එම අසම්භාව්‍ය බැරකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල වගකීම් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අසම්භව්‍ය බැරකම් හඳුනාගත් අවස්ථාවේදීම නිවැරදි ප්‍රතිපාදන සලසන ලෙස උපදෙස් දෙන ලදී. | වගකීම් හඳුනාගෙන නිසි ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව සභාව විසින් දැනටමත් භුක්ති විඳින හා සාධාරණ අගය හඳුනාගතහැකි ඉඩම් 04ක වටිනාකම ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සාධාරණ අගය හඳුනාගත හැකි වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ට අනුව තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික ද්‍රව්‍ය තොගය තුළ පැවති රු.මිලියන 1.29ක භාවිතයට ගත නොහැකි අයිතම් 97කට අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවලට සිදුකර නොතිබුණි. | 2024 වර්ෂයේදී වෙන්දේසි කිරීම්,මාරු කිරීම්,විනාශ කිරීම් හා නිකුත්කිරීම් සිදුකර ඇත. | තොග ගණනය කිරීමේ ප්‍රතිපත්තිය නිශ්චිතව හඳුනාගත යුතු අතර, භාවිතයට ගත නොහැකි අයිතම් පිළිබඳව අදාළ ගැලපීම් සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.871,474 ක අඩමාණ ණය වෙනුවෙන් වෙන්කර තිබුණද, ඊට අදාළ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට හෙළිදරව් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය වෙනුවෙන් ගෙවා තිබූ රු.මිලියන 2.17ක විගණන ගාස්තුව, විගණන ගාස්තු සඳහා වෙන් කිරීමේ ගිණුමට ගැලපීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ ඌණතාවය සහ විගණන ගාස්තු සඳහා වෙන් කිරීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කර ඇත. | ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල වන පරිදි ගිණුම් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පෙර වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 12ක් මගින් මිලදීගෙන තිබුණු රු.මිලියන 15.46 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂයේ සභාව වෙත ලබාදී තිබුණද, එම වත්කම් සභාවේ ප්‍රධාන කාර්යාලයේ වත්කම් ලේඛනයට හෝ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සභාව වෙනුවෙන් ලබා දී තිබුණු රු. මිලියන 6.64 ක ප්‍රතිපාදන සභාව වෙත ප්‍රේෂණය නොකර අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කර තිබීම නිසා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන හා සභාවේ ප්‍රාග්ධන | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට ගිණුම් ගත කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රදාන අතර රු.මිලියන 6.64 ක වෙනසක් නිරීක්ෂණය විය. | | |
| (ඇ) | ආසියානු සංවර්ධන බැංකු ප්‍රදාන යටතේ (SSDP) ක්‍රියාත්මක කරන ලද කාන්තා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියෙන් හා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් සභාව වෙත 2023 වර්ෂයේ හා 2015 වර්ෂයේ ලැබී තිබූ පිළිවෙළින් රු.මිලියන12.66ක සුහුරු පන්ති කාමර උපකරණවල වටිනාකම හා රු.මිලියන 63.90ක වටිනාකමින් යුත් වාහන 10 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ නිවැරදි කිරීමට උපදෙස් දෙන ලදී. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉදිරි වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේදී දරා තිබූ රු.මිලියන 3.68ක වියදම සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ඌණතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ නිවැරදි කරන ලදී. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු බව |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමකට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි රු.මිලියන 2.54 ක හඳුනා නොගත් බැරවීම් පැවති අතර, 2024 අප්‍රේල් මස වන විටත් එම බැරවීම් හඳුනාගෙන අදාළ ගැලපීම් කිරීමට කටයුතු නොකිරීම නිසා එම අගය රු.මිලියන 12.52ක් දක්වා වර්ධනය වී තිබුණි. | 2024.09.11දින අදායමට ගන්නා ලදී. | බැංකු ගිණුම් නිසි ලෙස පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | විධිමත් අනුමැතියකින් තොරව මානව හා භෞතික සම්පත් උපයෝජනය කර ගනිමින් පවත්වාගෙන යන ක්‍රීඩා සමාජ යටතේ සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.මිලියන 11.61 ක ඉතිරි කිරීම් ගිණුමේ ශේෂය, රු.20,000 ක ජංගම ගිණුම් ශේෂය හා රු.මිලියන 16.25 ක ස්ථාවර තැන්පතු ශේෂය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට ජාතික තරුණ සේවා සභාවේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කරන ලෙසට උපදෙස් දෙන ලදී. | වත්කම්, වගකීම්, ආදායම්, වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (උ) | මීරිගම පුහුණු මධ්‍යස්ථානය සඳහා තිරරෙදි මිලදී ගැනීම වෙනුවෙන් මීරිගම ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබූ රු. මිලියන 2.95ක අත්තිකාරම් මුදල එම කාර්ය සඳහා 2024 සැප්තැම්බර් 20 දින වන විටත් යොදවාගෙන නොතිබිණි. නමුත් එම මුදල සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ඌණතාවය හා අත්තිකාරම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | මෙම කාර්ය කඩිනමින් අවසන් කරන ලෙස ප්‍රාදේශිය ලේකම් ,මීරිගම වෙත 2024.09.02දිනැති ලිපිය මඟින් නැවත සිහිකැදවීම් සිදු කර ඇත. | ලබා දුන් අත්තිකාරම් මුදලට අදාළ කාර්යයන් ඉටු කර ගැනීමෙන් පසු පමණක් වියදම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම **රු.මිලියන** | අනුරූපී වාර්තා අනුව වටිනාකම **රු.මිලියන** | වෙනස **රු.මිලියන** | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| පරිපාලිත සමාගම වෙත ගෙවිය යුතු ශේෂය | 1.18 | 110.94 | 109.76 | ඉදිරියේදී සමාගම සමඟ සාකච්ඡාකර තිරණයක් ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදී. | සීමාසහිත යුත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමට ගෙවිය යුතු ණය ශේෂ සමාගමේ තොරතුරු සමඟ පරීක්ෂා කර නිවැරදි කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| **විෂයය** | **මුදල (රු.මිලියන)** | **නොසැපයූ විගණන සාක්ෂි** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| තරුණ සංවර්ධන වියදම්, දෙහිවල පුහුණු මධ්‍යස්ථානයේ ලාභය හා ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම් | 383.13 | උපලේඛණ, ලාභ ගණනය කිරීම පිළිබඳ විස්තර හා මිලදී ගත් ක්‍රීඩා භාණ්ඩ පිළිබඳ විස්තර | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ තරුණ සංවර්ධන වියදම් යටතේ දක්වා තිබූ රු.370,912,806.00 ක වියදම් සම්බන්ධයෙන් උපලේඛන තොරතුරු සකස්කර ඉදිරිපත්කර ඇත. | විගණනය විසින් ඉල්ලා සිටින ලද සියළුම ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

දෙහිවල පුහුණු මධ්‍යස්ථානයේ 2022.12.31 න් අවසන් මූල්‍ය වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කර ඇත.

මිලදී ගන්නා ලද ක්‍රීඩා භාණ්ඩයන්හි අවශ්‍යතා නිර්ණය කර ඇත්තේ 2021 හා 2022 වර්ෂයන්හි යෞවන සමාජ තරුණ තරුණියන් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් හා සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදිය.

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.මිලියන 144.55ක්වූ අතර, ඉන් වර්ෂ 05ට වැඩි කාලයක සිට පැවත එන රු. මිලියන 18.75ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ වටිනාකම් 2024 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | අයවිය යුතු මුදල් අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට හෝ අවශ්‍ය පරිදි කටයුතු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

#### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ සිට විවිධ කාර්යයන් සඳහා පෞද්ගලික ආයතනවලින් ලැබී තිබූ රු.මිලියන 1.85ක ලැබීම් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | තොරතුරු සොයා ගැනීමෙන් පසු ආදායමට ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට හෝ අවශ්‍ය පරිදි කටයුතු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 08 වගන්තිය | සභාව විසින් සකස් කරන ලද අයවැය ලේඛණයෙහි අරමුදල් ලැබෙන මාර්ග පිළිබඳව පුරෝකථනය සිදු නොකර වියදම් පමණක් පුරෝකථනය කර තිබුණි. | අයවැය ලේඛනයන්හි අරමුදල් ලැබෙන මාර්ග පිළිබඳව පුරෝකථනයන් සිදුකර අයවැය ලේඛන සකස් කිරිමට අපේක්ෂිතය. | අයවැය ලේඛණය කළමනාකරණ පාලන උපකාරකයක් ලෙස යොදවා ගැනීමට අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් මෙහෙයුම් අත්පොතෙහි 3.5 වගන්තිය | චක්‍රලේඛයට පටහැනිව වෙනත් අමාත්‍යාංශ සඳහා නිලධාරින් දෙදෙනෙකු කිසිදු අනුමැතියක් නොමැතිව මුදාහැර තිබුණි. | ජාතික තරුණ සේවා සභාවේ නිලධාරීන් වෙනත් අමාත්‍යාංශයකට හෝ ආයතනයකට තාවකාලික පදනම මත මුදාහැර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 ජනවාරි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015(2) | සභාවේ අධ්‍යක්ෂක ජනරාල් වරයා හා අධ්‍යක්ෂකවරු දෙදෙනෙකු චක්‍රලේඛ අනුව හිමිකම් ලබන ඉන්ධන දීමනාවට වඩා රු මිලියන . ක ඉන්ධන 2.48 .උපයෝජනය කර තිබුණි | තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2023 අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා කාලසීමාවට අදාලව පරිභෝජනය කරන ලද ඉන්ධන සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලබාගත යුතු අනුමැතීන් ලබා ගෙන ඇත. | විධිමත් අනුමැතියකින් තොරව සීමාව ඉක්මවා ඉන්ධන භාවිතා කිරීම වැළැක්විය යුතුය. |
| (ඈ) | 2009 අප්‍රේල්16 දිනැති 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව | සභාවේ පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපොළවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර ස්ථාපිත කර නොතිබුණි. | නව යන්ත්‍ර මිලදී ගැනීමට අදාල නිර්දේශ ලබා ගැනීම සඳහා සභාපති/තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු නිර්දේශ මත පදනම්ව ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය. | කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රය මගින් සටහන් කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) | XV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය | දිවයිනෙන් බැහැරව යෑමේදී අග්‍රාමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, ඊට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අධ්‍යක්ෂවරයෙකු විසින් රු.185,398 ක් වැය දරා රේඛීය අමාත්‍යවරයාගේ අනුමැතිය මත පමණක් විදේශ සංචාරයක් සඳහා සහභාගී වී තිබුණි. | ඉදිරියේදී සියලුම මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය තුමාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | අග්‍රාමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව විදේශ සංචාර ගතවීම වැළැක්විය යුතුය. |
| (ii) | XV ඡේදයේ 11.1 වගන්තිය | 2023 සැප්තැම්බර් මස 12 දින රු.මිලියන 39.40ක් වැය කර විදේශ සංචාරයක් සඳහා ආර්ථික පන්තියේ ප්‍රවේශ පත්‍රයක් භාවිතා කිරීම වෙනුවට අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත රු.මිලියන. 2.77ක වැය කර ව්‍යාපාරික පන්තියේ ප්‍රවේශපත්‍රයක් ලබාදී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි | නීති රීති රෙගුලාසිවලට පටහැනිව කටයුතු කිරීම වැළැක්විය යුතුය. |
| (ඊ) | අමාත්‍යාංශය මගින් පත්කළ කමිටුව විසින් නිකුත් කර ඇති සේවක ගැටළු හා අක්‍රමිකතා පිළිබඳ නිර්දේශයන්හි නිර්දේශ අංක 10 | නිර්දේශයට පටහැනිව තරුණ සේවා නිළධාරියෙකුට සහකාර අධ්‍යක්ෂ ඇතුළු (ආවරණ) .ක් ලබාදී තිබුණි03 තනතුරු | අමාත්‍යාංශය මගින් පත්කළ කමිටුව විසින් නිකුත් කර ඇති සේවක ගැටළු හා අක්‍රමිකතා පිළිබඳ නිර්දේශයන්හි නිර්දේශ අංක 10 යටතේ දැනට ලබා දී ඇති ආවරණ තනතුරු ඉවත් කිරීම සඳහා පියවර ගන්නා ලෙස දක්වා ඇති බැවින් මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට පෙර සභා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ආවරණ තනතුරු ඉවත් කිරීමට අපේක්ෂිතය. | අමාත්‍යාංශ කමිටු නිර්දේශය අනුව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2023 මාර්තු 31 දිනැති අංක13/2023 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | මූල්‍ය නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩු 06ක් සඳහා අභ්‍යන්තර උසස්කිරීම් තුළින් පිරවීමට තීරණය කර තිබුණද, එම තනතුරු මේ දක්වා පිරවීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් එක් නිලධාරියෙකු පළාත් 02ක මූල්‍ය නිලධාරී තනතුරෙහි රාජකාරී සිදු කරමින් තිබුණි. | 2023.03.31 දින පැවැති සභා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි සභා සංදේශ අංක 13/2023 අනුව මූල්‍ය නිලධාරි පුරප්පාඩු 06 සම්බන්ධයෙන් අභ්‍යන්තර උසස් වීම් සිදු කිරීමට සභා සංදේශය අනුමත කර ගෙන ඇති අතර, මේ අවස්ථාවේදි ජනාධිපතිවරණ ජන්දය පැවැත්වෙන බැවින්, ජන්දය නිම වූ වහාම මූල්‍ය නිලධාරි තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු සිදු කරනු ඇත. | මූල්‍ය නිලධාරී තනතුරු පිරවීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 68.3 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. මිලියන 255.7ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 187.4ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අභ්‍යන්තර ඉපයීම් හා රජයේ දායකත්වය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවක අර්ථසාධක අරමුදල වෙත නියමිත පරිදි දායක මුදල් ප්‍රේෂණය නොකිරීම මත රු.205,036 ක අධිභාරයක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීමට සිදුවී තිබුණි. | ගම්පහ කම්කරු කාර්යාලය මගින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු දැමීම හේතුවෙන් අධිකරණ නියෝග මත මෙම මුදල ගෙවීමට හේතු වී ඇත. | සේවක අර්ථසාධක අරමුදල වෙත නියමිත පරිදි දායක මුදල් ප්‍රේෂණය කිරීම කළ යුතුය. |
| (ආ) | සභාපතිවරයාගේ අභිමතය පරිදි නිලධාරීන් හා විවිධ බාහිර ආයතන සඳහා සභාවේ ගොඩනැගිලි නොමිලේ හෝ වට්ටම් සහිතව ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් නොමැති වුවද, පෞද්ගලික ආයතන සඳහා ගොඩනැගිලි නොමිලේ සහ වට්ටම් සහිතව කුලියට ලබාදීම හේතුවෙන් රු.මිලියන 3.80ක බදු කුලී ආදායමක් සමාලෝචිත වර්ෂයේ සභාවට අහිමි වී තිබුණි. | ශ්‍රී ලංකා යුත් පරිශ්‍රයේ පහසුකම් සැපයීම සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම සඳහා වන ජාතික තරුණ සේවා සභාවේ සභා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය 2022/24 මගින් දක්වා ඇත. | අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු අතර, සභාවේ සම්පත් කුලියට ලබා දීමේදී ඒ සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස් කරගත යුතුය. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම- | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | යෞවන සමාජවල තරුණ තරුණියන්ගේ දායකත්වයෙන් නව නිර්මාණ එළිදැක්වීම සභාවේ එක් අරමුණක් වුවද, ඊට පටහැනිව නළු නිළියන් සම්බන්ධ කරගෙන ටෙලිනාට්‍යයක් නිෂ්පාදනය කර ඒ සඳහා රු.මිලියන 4.83ක් දරා තිබූ අතර, මේ දක්වා එම ටෙලි නාට්‍යයේ කටයුතු ද අවසන් කර නොතිබුණි . | ස්වාධීන රූපවාහිනී නාලිකාව විසින් මැතිවරණයෙන් පසුව අදාළ කොටස් විකාශනය කිරීම සඳහා එකඟතාවය පල කර ඇත. ඒ අනුව මෙම ටෙලි නිර්මාණය රූපවාහිනි නාලිකාවක් වෙත මුදල් අයකර ලබාදීමට කඩිනමින් කටයුතු කරන අතර ඉදිරියේදී මෙවන් අනාර්ථකාරී කාර්යයන් සඳහා යොමු නොවන ලෙසට සියලු නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණු ඉටුවන පරිදි සැලසුම් පිළියෙළ කර නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතු අතර, රජයේ මුදල් අරපිරිමැසුම්දායකව භාවිතා කිරීම ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම- | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමයේ කාර්යාල ස්ථාපිත කර තිබුණද ,ඒ සඳහා කිසිදු බදු කුලියක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි බදු කුලී අය කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීමට සටහන් කර ගන්නා ලදි. | ආදායම් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ආ) | තරුණ තරුණියන් නව කෘෂි තාක්ෂණයට ඉක්මණින් අනුගත කරවීම අරමුණු කොට රු.මිලියන 250 ක ප්‍රතිපාදන යටතේ 2022-2025 වර්ෂ තුල ක්‍රියාත්මක කිරීමට සකස් කරන ලද කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන හා තරුණ කෘෂි නිෂ්පාදන සමාගම් පිහිටුවීමේ වැඩසටහන කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයේදීද ක්‍රියාත්මක කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ නියමිත පරිදි කෘෂි සමාගම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුව ද මේ වන විටත් කෘෂි සමාගම් 21ක් ලංකාව පුරා ස්ථාපිත කර ඇත. | කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන හා තරුණ කෘෂි නිෂ්පාදන සමාගම් පිහිටුවීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාවේ ප්‍රධාන ගබඩාවේ පැවති වටිනාකම රු.මිලියන 3.5 ක්වූ අයිතම වර්ග 37ක් ප්‍රධාන ගබඩාවෙන් විවිධ පුද්ගලයන් හා විවිධ ආයතන වෙත තාවකාලික පදනමින් ලබා දී තිබූ අතර, ඒවා නැවත ප්‍රධාන ගබඩාව වෙත ලබා ගැනීමට හෝ වගකිව යුතු නිලධාරීන්ගෙන් එම වටිනාකම අයකර ගැනීමට හෝ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වසර ගණනාවක් පැරණි වටිනාකම් අයකර ගැනීම් සඳහා ප්‍රමාණවත් ලිඛිත තොරතුරු සහ ලේඛන සොයා ගැනීමට පවතී නම් ඒ පිළිබඳ සලකා බලා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 2021.11.16 දිනැති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ | සභාවට අහිමි වී ගිය වටිනාකම අප්‍රමාදව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීම් සිදුකර පද්ධතිය ක්‍රමවත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මෙහෙයුම් අත්පොතෙහි පරිච්ඡේද අංක 6.9හි සඳහන් පරිදි කටයුතු කිරීමට අපේක්ෂිතය. | |
| (ඇ) | 34 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල වෙනුවෙන් මිලදී ගත් රු.729,600 ක් වටිනා ටී-ෂර්ට් 768ක් එම උත්සවය නිමා වීමෙන් පසු ගබඩාවෙන් කිහිප අවස්ථාවකදී නිකුත් කර තිබූ අතර , ඉන් රු.320,150 ක් වටිනා ටී-ෂර්ට් 337ක් එය ලබාගත් තැනැත්තා කවුරුන්ද යන්න සඳහන් නොකර අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය ලෙස සඳහන් කර ගබඩාවෙන් නිකුත් කර තිබුණි .තවද, පාසල් හා යෞවන සමාජ මට්ටමින් බෙදාහැරීම සඳහා මිලදීගත් රු.800,000 ක පාපන්දු 100 ක් අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය නමින් නිකුත් කර තිබුණි. | සභාපතිතුමා විටින් විට දිවයිනේ තරුණ තරුණියන් කණ්ඩායම් වශයෙන් හමුවන අවස්ථා යොදාගෙන තිබූ අතර, එවැනි අවස්ථාවලදී එම තරුණ තරුණියන් වෙත මෙම ටී ෂර්ට් ලබාදී ඇත. එසේ ලබාදීමේදී විවිධ ජාතික තරඟ සඳහා දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් සහභාගී වූ තරුණ තරුණියන් සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇත. පොලිස් දෙපාර්තමේන්තුව විසින් තරුණ ක්‍රීඩා කණ්ඩායම් වෙත නිකුත් කිරීමට පාපන්දු 100ක් ලබා දෙන ලෙස එවකට හිටපු විෂය භාර ගරු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙතින් කරන ලද ඉල්ලීමකට අනුව, ප්‍රධාන ගබඩාවෙන් මෙම පාපන්දු අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයට ලබාගෙන පොලිස් දෙපාර්තමේන්තුවට නිකුත් කර ඇත. | ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩ බෙදාහැරීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනතේ 4 (ඊ), 5(2)(උ) සහ 5(2)(ඌ) වගන්ති ප්‍රකාරව තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කිරීමට ගොවිපොළවල් ආරම්භ කිරීම අරමුණ වුවද, සභාවේ පවතින ගොවිපොළ 09ක පුහුණු පාඨමාලා පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | සභාව සතුව පවතින ගොවිපළ 05ක කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල පාඨමාලා මේ වන විට ක්‍රියාත්මක වන අතර, 2025 වර්ෂයේ ජනවාරි මස වන විට තවත් ගොවිපළ 04 ක කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල පාඨමාලා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. | පනතේ දක්වා ඇති අරමුණු ඉටු කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020, 2021 සහ 2022 වර්ෂවලදී දෙහිවල පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා සඳහා ගාස්තු ගෙවා ලියාපදිංචි නොකරන ලද සිසුන් 341දෙනෙකු සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ජාතික වෘත්තීය සුදුසුකම් සහිත (NVQ) සහතිකපත් පිරිනමා තිබුණි. තවද, සහතිකපත් නිකුත් කිරීමේ බලයක් පුහුණු මධ්‍යස්ථානයට නොමැති වුවද, ඊට පටහැනිව සභාවේ විභාග හා ඇගයීම් අංශයෙන් සනාථ නොවුණු සහතිකපත් 791ක් පුහුණු මධ්‍යස්ථානය විසින් නිකුත් කර තිබුණි. | නිකුත් කරන ලද සහතිකවල තොරතුරු Scan කර විභාග ඇගයීම් අංශයේ දත්ත පද්ධතියට ඇතුලත් කර සුරක්ෂිත කර ඇත.සඳහන් කර ඇති සහතිකපත් 791ද විභාග අංශයෙන් නිකුත් කර ඇත. | සහතිකපත් නිකුත් කිරීමේදී විනිවිදභාවයෙන් කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඩ්‍රෝන තාක්ෂණය භාවිතා කර ගොවිපොළ මධ්‍යස්ථාන 11ක මැනුම් කටයුතු සඳහා පුද්ගලික ආයතන 02ක් වෙත රු.මිලියන 2.16ක් ගෙවා තිබුණද, ඒ අනුව සකස් කළ නීත්‍යානුකූල මැනුම් සටහන් මේ වන තෙක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල භූමියේ ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගෙන නියමිත භූමිය සංවර්ධනය කිරීම සඳහා මෙම මිනුම් කටයුතු සිදුකර ඇති අතර ඊට අදාල දත්ත ආයතනය සතුව පවතී.<br><br>දත්ත ලබා දීමෙන් අනතුරුව ගෙවීම් කටයුතු සිදුකර ඇති බව වැඩි දුරටත් දන්වමි. | නීත්‍යානුකූල මැනුම් සටහන් අනුව සැලසුම් සකස් කිරීම කළ යුතුය. |
| (ඈ) | 2014 සිට 2023 වර්ෂයේ ආරම්භය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ධාවනයෙන් ඉවත් කරන ලද වාහන 04ක් අපහරණ කිරීමට හෝ අළුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමට හෝ කටයුතු නොකර සභාවේ හා පුහුණු මධ්‍යස්ථානවල ගාල්කර තිබුණි .තවද, තවත් වාහන 10ක් වර්ෂය පුරා ධාවනය කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | එම වාහන අතරින් 09ක් මේ වනවිට වෙන්දේසිකර ඇති අතර එක් වාහනයක් පුහුණු කටයුතු සඳහා ලබාදී ඇත . | වාහන පරිහරණය කළමනාකරණය කළ යුතුය. |

**3.4 මත භේදයට තුඩු දෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තරුණ තරුණියන් කලාපීය ජාත්‍යන්තර තරුණ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගී කරගැනීමට වෙන් කරන ලද රු.මිලියන 4.89ක ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, | අදහස් දක්වා නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව වෙන් කරන ලද ප්‍රතිපාදන එම කාර්යයන් සඳහා යෙදවීමට කළමනාකරණය විසින් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යක්ෂ (කාර්මික හා වෘත්තීය පුහුණු) හා සභාවට සම්බන්ධයක් නොමැති කාන්තාවක් පමණක් විදේශ සංචාරවලට සහභාගී වී තිබුණි. | | |
| (ආ) | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව 2023 දෙසැම්බර් 31 දින නෙළුම් කුළුණ පරිශ්‍රයේදී පැවැත්වුණු සංගීතමය වැඩසටහනට සභාව විසින් රු.මිලියන 10.29ක් වැය කර තිබුණද, එම වැඩසටහන පැවැත්වීමෙන් ලද රු.මිලියන 6.86ක ටිකට්පත් ආදායම සභාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සභාවේ අරමුණුවලට අදාළ නොවන දේශගුණික විපර්යාස මැඩලීම යන මැයෙන් වූ මාර්ගගත ක්‍රමය ඔස්සේ පෞද්ගලික හෝටලයක පවත්වා තිබූ වැඩසටහනක් සඳහා රු.මිලියන.1.19ක් වියදම් කර තිබුණි. | සභාපති/තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ උපදෙස් පරිදි 2023 වර්ෂයේ නොවැම්බර් මස 05 වන දින දේශගුණික විපර්යාස මැඩලීම පිළිබඳ වැඩමුළුව පවත්වන ලදී. | කළමනාකරණය තොරතුරු සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම කළ යුතුය. |
| (ඈ) | සභාපතිවරයාගේ අභිමතය පරිදි සභාවේ කාර්ය මණ්ඩයේ නොමැති ස්වේච්ඡා තනතුරක් සඳහා පුද්ගලයෙකු බඳවාගෙන ඔහු වෙත සභාවේ නේවාසිකාගාරයේ නවාතැන් පහසුකම් හා අධ්‍යක්ෂ ජනරාල්වරයාට වෙන් කරන ලද වාහනය ඔහු වෙත ලබා දී ඒ සඳහා ඉන්ධන සැපයීමෙන් රාජ්‍ය සම්පත් අවිධිමත්ව පරිහරණයට ඉඩ සලසා තිබුණි. | නැවත මෙවැනි තත්ත්වයක් ඇති නොවන බව දන්වා සිටිමි. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් නොමැතිව බටහිර පළාත් අධ්‍යක්ෂ විසින් සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ රොබෝටික් පුහුණු පාඨමාලාව ආරම්භ කිරිමේ අරමුණින් මිලදී ගන්නා ලද රු.මිලියන 17.42 ක උපකරණ මිලදිගෙන තිබුණි. නමුත් එම පාඨමාලාව ආරම්භ කිරිමට අපොහොසත් වූ බැවින් නිෂ්ක්‍රීයව | නව උපදේශකවරුන් යටතේ 2024.10.01 දින සිට නව පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම්කර ඇත.<br><br>ඉදිරි වර්ෂයේ (2024) යෞවන සම්මාන තරගාවලියෙන් ජයග්‍රහණය කරනු ලබන ජයග්‍රාහකයින් | නිෂ්කාර්ය සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. තවද, නිසිලෙස අවශ්‍යතාවය පුරෝකථනය නොකොට සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් එකතුව රු.මිලියන 7.70ක් වටිනා සම්මාන 31ක් හා පුටු හා වායු සමීකරණ උපකරණ ප්‍රයෝජනයට නොගෙන මේ දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | සඳහා ප්‍රදානය කිරීමට තීරණය කර ඇත. | |
| (ආ) | සභාව විසින් 2023 හා පසුගිය වර්ෂ තුළ රු.මිලියන 4.7ක් වැයකර ඇඟිලි සළකුණු සටහන් යන්ත්‍ර මිලදීගෙන තිබුණද ,එම යන්ත්‍ර නිසි ලෙස ක්‍රියාත්මක කර නොතිබීම නිසා ඌණ උපයෝජිතව පැවතුණි. | නව යන්ත්‍ර මිලදී ගැනීමට අදාල නිර්දේශ ලබා ගැනීම සඳහා සභාපති/තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු නිර්දේශ මත පදනම්ව ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය. | ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කිරීම සඳහා කළමනාකරණය කඩිනමින් පියවර ගත යුතුය. |

### 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 16 දින සිට 19 දින දක්වා පැවැත්වූ 34 වන ජාතික යෞවන ක්‍රීඩා උළෙල පැවැත්වීම වෙනුවෙන් රු. මිලියන 9.7 ක ආහාර, වතුර බෝතල් හා ටී-ෂර්ට් මිලදී ගැනීමේදී තරගකාරී මිල කැඳවීමකින් තොරව මිල කමිටුවක් මගින් එය සිදුකර තිබුණි. මේ හේතුවෙන්, වෙළෙඳපොළේ පවතින තොග මිල අනුව මි.ලී. 500 පානීය ජල බෝතල් 20600 ක් රු.30 බැගින් මිලදී ගැනීමට අවස්ථාව තිබියදී, එය නොසළකා රු.70 බැගින් මිලදීගෙන තිබීමෙන් රජයට රු. 824,000ක පාඩුවක් සිදු කර තිබුණි. | කිසිදු අවස්ථාවක රු.30.00ක මිල ගණනක් සමාගම විසින් ඉදිරිපත් කර නොමැති නිසා කිසිදු අවිධිමත් ගෙවීමක් සිදුකර නොමැති බව මෙයින් දන්වා සිටිමි. | සභාව වෙත උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවන පරිදි තරගකාරී මිල පදනම මත මෙවැනි ප්‍රසම්පාදනයන් සිදුකළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1994 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ දේශපාලන හේතූන් මත විවිධ ගැටළුවලට මුහුණු දුන් අයට සහන සැලසීම සඳහා අමප අංක 005/734/0186/17 දරන හා 2017 පෙබරවාරි 02දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විශ්‍රාම නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් නොකර ඊට පටහැනිව පත් කරන ලද කමිටුවලින් නිර්දේශ ලබාගනිමින් නිලධාරීන් 40 දෙනෙකු සඳහා සහන ලබාදී තිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව දන්වා සිටිමි. | නිර්දේශ ලබාදුන් නිලධාරීන් 40 දෙනෙකුගේ උසස්වීම්, වැටුප් වර්ධක ලබාදීම්, හිග වැටුප් ගෙවීම් සමබන්ධයෙන් නැවත සළකා බැලිය යුතුය. |
| (ආ) | සභාවේ ප්‍රධානම මාණ්ඩලික තනතුරු 03ක් වන අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂ(සංවර්ධන) හා අධ්‍යක්ෂ (පුහුණු) තනතුරු සඳහා ස්ථිර පදනමින් පත්වීම් සිදු නොකර ද්වීතිය හා කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම වසර ගණනාවක් සිට සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් 2023 අගෝස්තු 19 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ස්ථිර පදනමින් සුදුසුකම් අනුව නිලධාරීන් බඳවා ගැනීමට අනුමත කර තිබුණද, මේ දක්වා එය සිදුකර නොතිබුණි. | සභාවේ ප්‍රධානතම මාණ්ඩලික තනතුරු 03 වන අධ්‍යක්ෂ(මුදල්)/ අධ්‍යක්ෂ (සංවර්ධන)/ අධ්‍යක්ෂ (පුහුණු) තනතුරු 03 සඳහා සුදුසුකම් සපුරන නිලධාරින් ස්ථිර පදනමින් බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන අනුව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර, සමාගම විසින් 2018 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා යූත් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම හා ජාතික තරුණ සේවා සභාව සමඟ ඒකාබද්ධ කර 2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට උපදෙස් දී ඇත. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සභාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2024 මැයි 21 දිනදීය. | 2024.05.08 දින ප්‍රධාන අභ්‍යන්තර විගණන තනතුරෙන් ඉවත් කර අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ පිහිටුවන ලදී. එකී තත්වය මත මෙම ප්‍රමාදය ඇති වී තිබුණි. | පනත ප්‍රකාරව නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

**4.2** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ පරිපාලිත සමාගමක් වන යුත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමේ ගණකාධිකාරීවරයා ලෙස සේවය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් මුදාහරින ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ නිලධාරියෙකු සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස රාජකාරී කරමින් සිටියදී අධ්‍යක්ෂ (මුදල්) තනතුරේද කටයුතු කිරීම සඳහා පත් කර තිබීම නිසා සභාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය දුර්වල වී තිබුණි. | මේ වන විට එම තත්වය නිවැරදි කර ඇති බව දන්වා සිටිමි. | අභ්‍යන්තර විගණනය ස්වාධීනව කළ හැකි වන පරිදි අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |